# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,550 — 1965 නොවැම්බර් 5 වැනි සිකුරාදා — 1965.11.5

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම ... ... | 135 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | 136 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත්කිරීම් ... ... | — | | |


## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### මධ්‍යම පළාත

#### නුවරඑළියේ දිස්ත්‍රික් උසාවියේදිය

කොළඹ දේශීය ආදායම් කොමසාරිස්තුමා..................පැමිණිලිකරු.

එම්: 5187. එදිරිව

නැසීගිය ඒ. සී. අබ්දීන් මහතාගේ මුදලියේ අද්මිනිස්ත්‍රාසි බලකාරියන් වන, (1) වැල්ලවත්තේ 42 වැනි පටුමාවතේ අංක 60 දරණ ස්ථානයේ පදිංචි නූර් සරිනා අබ් දීන් මැතිනිය සහ (2) කොළඹ ග්‍රෙගරි පාරේ අංක 2 දරණ ස්ථානයේ පදිංචි රාබියා නිලූෆර් මෂූර් මැතිනිය ......................... බලකාරියන්

මෙහි පහත සඳහන් දේපොල ඉහතකී නඩුවේ නැසීගිය ඒ. සී. අබ් දීන් මහතාගේ මුදලයේ අද්මිනිස්ත්‍රාසි බලකාරියන් වන (1) වැල්ලවත්තේ 42 වැනි පටු මාවතේ අංක 60 දරන ස්ථානයේ පදිංචි නූර් සරිනා අබ්දීන් මැතිනිය සහ (2) කොළඹ ග්‍රෙගරි පාරේ අංක 2 දරණ ස්ථානයේ පදිංචි රාබියා නිලූෆර් මෂූර් මැතිනියටත් තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත්, රු. 17,37,789 ක් සහ අනිකුත් සියලු වියදම් ද පිස්කල් ගාස්තුද අයකර ගැනීමට, 1965 ක්වූ නොවැම්බර් මස 30 වෙනි දින පෙරවරු 11 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

මධ්‍යම පළාතේ නුවරඑළියේ වෝටර්ෆීල්ඩ් ඩ්‍රයිව් හි අංක 20 දරණ ස්ථානයෙහි පිහිටා තිබෙන ගේදොර ඇතුළු බිම් කැබැල්ලට මායිම්:—උතුරට: නුවරඑළියේ වෝටර්ෆීල්ඩ් ඩ්‍රයිව් හි අංක 20 සහ 21 දරණ ස්ථාන අතරින් වැටී ඇති අඩි පාර; නැගෙනහිරට: ටෙරන්ස් නමැති ඉඩම; දකුණට: නන්දන නමැති ඉඩම සහ බස්නාහිරට: නුවරඑළියේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාර වන, වෝටර්ෆීල්ඩ් ඩ්‍රයිව්.

ඉඩමේ ප්‍රමාණය: අක්කර 0, රූඩ් 1, පර්චස් ·39 18/100.

ඇස්. ආර්. ඩබ්ලිව්. පී. අමරසිංහ,
නුවරඑළියේ අතිරේක නියෝජ්‍ය පිස්කල්.

1965 ක්වූ ජූනි මස 30 වෙනි දින,
නුවරඑළියේ නියෝජ්‍ය පිස්කල් කාර්යාලයේදිය.

11-153

---

### විශේෂ නිවේදනයයි

1965 නොවැම්බර් 8 වැනි සඳුදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1965 නොවැම්බර් 12 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1965 නොවැම්බර් 6 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 ඔක්තෝබර් 29 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

---

135——B 62481—1,755 (65/10)

D 1

ජාතික පුස්

# මුදල් තඩු පිළිබඳ දැන්වීම්

## කුලියාපිටියේ පවත්වන කුරුණෑගල දිස්ත්‍රික් උසාවියේදීය

නඩුසයි ආඥාපයි

මුදල් නඩු අංකය 113/වී — මැදපත්තු බස්නාහිර කෝරළේ ඉංශුදවුල ඉහා ගම පදිංචිව සිට මැසීගිය හපු ආරච්චිල්ලාගේ සියතුහාමි විදානයාගේ අන්තිම කැමති පත්‍රයකින් නොදැවරු බූදලයේ කාරණය ගැනයි.

එකී ඉංශ්‍රදවුලේ පදිංචි හපු ආරච්චිල්ලාගේ ජයසේකර.............

.................................................................. පෙත්සම්කරු.

සහ

(1) ඉංශ්‍රදවුලේ පදිංචි ජයසුන් දර මුදියන්සේලාගේ ඩයිමන්නාද,
(2) ඉංශ්‍රදවුලේ පදිංචි හපු ආරච්චිල්ලාගේ සුමනාවතී ද යන අය
අනරේකී......................................................... වගඋත්තරකරුවෝ.

මෙම කාරණය කුලියාපිටියේ පදිංචි කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් විනිශ්චයකාර ඇස්. ජෝකනාදන් මහතා ඉදිරිපිටදී වර්ෂ 1965 ක්වූ ජූනි මස 22 වෙනි දින පෙත්සම්කරු වෙනුවෙන් ජේ. බී. ඇම්. ද අල්විස් නීතිඥ මහතා පෙනී සිටියදී විභාගය පිණිස ගෙන, පෙත්සම්කරුගේ පෙත්සම සහ ඔහුගේ වර්ෂ 1965ක්වූ ජූනි මස 21 වෙනි දින දරණ දිව්රුම් පත්‍රද කියවා බලා, ඉහතකී වගඋත්තරකරුවන් හෝ ඉහතකී බූදලය සම්බන්ධව සැලකිලි දක්වන වෙනත් අයෙක් හෝ අයවලුන් විසින් වර්ෂ 1965 අගෝස්තු 5 වෙනි දින හෝ ඊට ප්‍රථම මේ උසාවියට ඒන්තු යනාකාර විරුද්ධවාදිකම් නොදක්වා සිටියොත්, එම බූදලය සම්බන්ධ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ඉහතකී නැසීගිය දයගේ වැඩිමහලු දරුවාවූ පෙත්සම්කරුට පවරා දෙන බව මෙයින් නියෝග කරන්ට යෙදුනා ඇත.

ඇස්. ජෝකනාදන්,
අතිරේක දිස්ත්‍රික් විනිශ්චයකරු.

වර්ෂ 1965 ජූනි 22 දින දීය.

" මීට විරුද්ධව කරුණු දක්වීමේ දිනය 1966 ජනවාරි 27 දින තෙක් දීර්ඝ කරණ ලදී."

ඇස්. ජෝකනාදන්,
අතිරේක දිස්ත්‍රික් විනිශ්චයකාර.

1965 ඔක්තෝබර් 28.
11-456

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරව පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයක්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමඟ කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති නැතට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමඟම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, තැපැල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෝෂ වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 220 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති නැතට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

13. 63.8.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 27 50 | ... | 40 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 17 50 | ... | 23 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 25 0 | ... | 33 0 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් මිලදීමට තිබෙන නම්)

| | මිල රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී එක කොටසක් ... ... ... | 0 30 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... | 0 60 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 15 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 30 | ... | 0 15 |

දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

ලංකාවේ වැලිවේරියයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.